මාධ්‍ය නිවේදනය

# ශ්‍රී ලංකාවේ සංචාරයේ අවසානයේ එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් මහ කොමසාරිස් සෙයිඩ් රාඩ් අල් හුසේන් විසින් කරන ලද ප්‍රකාශය.

2016 පෙබරවාරි 9, කොළඹ දී.

සුභ සැන්දෑවක්, ඔබගේ පැමිණීමට ස්තුතියි.

මා ඔබ හමුවට පැමිණියේ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන, අගමැති රනිල් වික්‍රමසිංහ සහ විපක්ෂ නායක සමග පැවති හමුවීම්වලින් මගේ මෙම සංචාරයේ රැස්වීම් අවසන් කිරීමෙන් මද වේලාවකට පසුවය. එහිදී අපි ශ්‍රී ලංකාවේ අනාගතයට බලපෑ හැකි ක්ෂේත්‍ර ගණනාවක වැදගත් කරුණු රැසක් ගැන සාකච්ඡා කෙළෙමු. මම පසුගිය සෙනසුරාදා මෙහි පැමිණීමෙන් පසු විදේශ කටයුතු, අධිකරණ, ජාතික සංවාද සහ බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන සහ නැවත පදිංචි කිරීමේ ඇමතිවරුන් මෙන්ම ආරක්ෂක ලේකම්, ආරක්ෂක කාර්ය මණ්ඩල ප්‍රධානි, යුද හමුදාපති සහ ගුවන් හමුදාපති සහ නාවික හමුදාවේ කාර්ය මණ්ඩල ප්‍රධානින් ද හමු වූයෙමි.

ඊට අමතරව මම කොළඹ දී ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිසම සහ ඉදිරියේ පිහිටවීමට යන සංක්‍රාමිය යුක්තිය පිළිබඳ ජාතික උපදේශන වලට නායකත්වය ලබා දෙන කාර්ය සාධක බලකායද මුණ ගැසුණෙමි. මම ක්‍රියාශීලී සිවිල් සමාජ සංවිධානවල සාමාජිකයන් ඇතුළුව ශ්‍රී ලංකාවේ විශිෂ්ටතම චින්තකයන් සහ විශ්ලේෂකයින් මුණ ගැසුණෙමි.

ඉරිදා උතුරු සහ නැගෙනහිර පළාත්වල සංචාරය කළ මට මහ ඇමතිවරුන්, පළාත් සභා සාමාජිකයන් මෙන්ම ආණ්ඩුකාරවරුන් හමු වූ අතර ඊයේ උදෑසන මහනුවර පූජනීය දළදා මාලිගයට යැමට ලැබුණු අවස්ථාව ගෞරවයක් කොට ස ලකමි. එහිදී මල්වත්ත සහ අස්ගිරිය පාර්ශ්වවල මහා නායකවරුන් විසින් මා කාරුණිකව පිළිගනු ලැබිණ. මෙම සුවිශේෂී අවස්ථාව ලබා දුන් ඔවුන්ටත් කොළඹ, යාපනය සහ ත්‍රිකුණාමලයේ දි හමු වූ හින්දු, මුස්ලිම් සහ ක්‍රිස්තියානි ප්‍රජාවන් හි සාමාජිකයන්ටත් මම කෘතවේදී වන්නෙමි.

මෙම සංචාරය, ඔබට සිහි කළ හැකි ආකාරයට මට පෙර සිටි මහ කොමසාරිස් වරිය 2013 අගෝස්තු මාසයේ දී මානව අයිතිවාසිකම් පිළිබඳ ඕනෑම මහ කොමසාරිස්වරයෙකු විසින් ඒ දිනවල මතු කළ යුතු උණුසුම් කරුණු ප්‍රශ්න ගණනාවක් මතු කිරීම නිසාම ඇගේ අවංක භාවය ගැන අපහාසාත්මක ප්‍රහාරවලින් සනිටුහන් වූ සංචාරයට වඩා බෙහෙවින් වෙනස් වූ මිත්‍රශීලී, සහයෝගී සහ දිරිමත් කරවන සංචාරයකි.

ඔවුන්ගෙන් සමහරෙක් මට ද ඒ සමාන පිළිගැනීමක් – මම ඒ පෝස්ටර් දුටුවෙමි - ලබා දුන් බව මම දනිමි. සිවිල් සමාජයේ මධ්‍යස්ථ හඬ ඇතුළත් සියලු දෙනාගේම හඬත්, සමහරවිට වෛරී සහ අවිචාරාත්මක හඬ තවමත් ප්‍රබලව නැගෙන නිසා එහි ප්‍රතිඵලයක් වශයෙන් අවශ්‍ය ප්‍රමාණයටත් වඩා ඊට සවන් දෙන තත්වයක් පවතින නමුත් ශ්‍රී ලංකාවේ පවතින නව වාතාවරණය ගැන මම සතුටු වෙමි.

ජන මාධ්‍යයේ ඔබ හොඳින් දන්නා පරිදි දූන් ඔබ කැමති දෙයක් ලිවීමටත්, වාර්තා කළ යුතුයැයි හැඟෙන දෙයක් වාර්තා කිරීමටත් ඇති වඩාත් නිදහස් තත්වයක් යටතේ පසුගිය වසර තුළ ශ්‍රී ලංකාව දිගු ගමනක් ගොස් ඇත. භීතිය පිළිබඳ හැඟීම අඩුම වශයෙන් කොළම සහ දකුණේ සැලකිය යුතු ප්‍රමාණයකින් පහව ගොස් ඇත. උතුරේ සහ නැගෙනහිර යටපත් වුවද කණගාටුවට මෙන් එය තවමත් පවතී.

සිදුව ඇති ප්‍රගතිය ගැන පවතින අදහස්වල කැපී පෙනෙන වෙනස්කම් පවතින නමුත් ප්‍රගතියක් පැවතිම ගැන සියලු දෙනාම එකඟ වෙති. නීතියේ සහ සාමය රැකීමේ සියලු නියමයන්ට පරිබාහිරව ක්‍රියාත්මක

වූ සහ අදහස් කළ ආකාරයටම ජනමාධ්‍යවේදීන්, මානව අයිතිවාසිකම් ආරක්ෂකයන්, සහ ආණ්ඩුවේ හෝ රාජ්‍ය ආරක්ෂක ආයතන විවේචනය කිරීමට ඉදිරිපත් වූ අනෙකුත් අය තුළ භීතිය දන වූ සුදු වෑන් වලින් කෙරෙන පැහැර ගැනීම් දන් වාර්තා වෙන්නේ කලාතුරකිනි. වධ හිංසා පිළිබඳ පැමිණිලි අඩු නමුත් 2015 දී සිදු වූයේයැයි කියන සමහර සිද්ධීන් වැනි මෑතකදී වාර්තා වූ සිද්ධීන් දෙකකින් දක්වෙන ආකාරයට ඒවා තවමත් පවතී. ප්‍රචණ්ඩත්වයට සහ අසීමිතව බලය යෙදවීමට පොලීසිය තවමත් යොමු වේ.

1950 ගණන්වල මුල භාගයෙන් පසුව ප්‍රථම වරට නිදහස් දිනයේ දී ජාතික ගීය සිංහලෙන් සහ දෙමළෙන් ගායනා කිරීමට ගත් තීරණය ඇතුළුව අන්තර් වාර්ගික සම්බන්ධතා කෙරේ සාධනීය බලපෑමක් ඇති කෙරෙන බෙහෙවින්ම සංකේතාත්මක වූ පියවර ගණනාවක් මෑතකදී ගෙන ඇත. ඊට පසු දින ප්‍රතිචාරයක් වශයෙන් උතුරු පළාතේ මහ ඇමතිවරයා යාපනයේ බෞද්ධ පන්සලට ගොස් ගරු බුහුමන් දක් වූයේය. කෙළේය. ජනවාරි මාසයේ දි ජනාධිපතිවරයා වරක් තමා ඝාතනය කිරීමට සැලසුම් කිරීම වෙනුවෙන් සිර දඬුවම් විඳින එල්ටීටීඊ සිරකරුවෙකුට සමාව ලබා දුන්නේය. මේවා වසර ගණනාවක් පැවති ගැටුමෙන් ගැඹුරු වේදනා විඳින ජන වර්ග අතර ප්‍රතිසන්ධානය සඳහා වූ මාර්ගයේ කැපී පෙනෙන පියවර ය. ශ්‍රී ලංකාවේ සියලු ප්‍රදේශවලින් තරුණයන් විශාල සංඛ්‍යාවක් උතුර හා නැගෙනහිර සමග එක් කිරීමට විශාල අන්තර්වාර්ගික වැඩ සටහන් සැලසුම් කර ඇති බව දනගන්නට ලැබීම මගේ සතුටට හේතු වේ. එම පළාත් දෙකේම ආණ්ඩුකාරවරුන් දෙදෙනාම සිවිල් වැසියන්ය. එය තවත් යහපත් වර්ධනයකි.

පසුගිය වසරේ දී අත්කර ගත් ඉතාමත් වැදගත් දිර්ඝ කාලීන ජයග්‍රහණවලින් එකක් වනුයේ ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිසමේ සුජාත භාවය සහ එහි ස්වාධීනත්වය ප්‍රතිස්ථාපනය කිරීමයි. විධිමත් ව්‍යවස්ථාමය ක්‍රියාවලියක් තුළින් ඉතා ඉහළ අවංක භාවයක් ඇති නව නායකත්වයක් පත් කිරීම ඉමහත් වැදගත් කමකින් යුත් මෙම ජාතික ආයතනය නැවත පණ ගැන්වීමේ නව ආරම්භයක් වනු ඇත. ආණ්ඩුව  එම ආයතනයට සම්පත් මෙන්ම ඒ සියල්ලටත් වඩා එහි පූර්ණ හැකියාවන් විදහා දක්වීමට අවශ්‍ය ආයතනික ගරුත්වය ලබා දීමෙන් සියලුම ශ්‍රී ලාංකිකයන්ගේ මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට පමණක් නොව මානව අයිතිවාසිකම් දක්මකින් නීති සහ ප්‍රතිපත්ති පිළිබඳව විශේෂඥ උපදෙස් ලබා දීමටත් අවස්ථාවක් කඩිනමෙන් සැලසෙනු ඇතැයි මම අපේක්ෂා කරමි.

මේවා සහ මා සඳහන් නොකළ තවත් ප්‍රගතීන් තිබුණද ජීවිත දස දහස් ගණනක් අහිමි විමට අමතරව රාජ්‍යයේ අත්‍යාවශ්‍ය අංග ලක්ෂණ ගණනාවක් සෝදා පාළුවට ලක් වූ වසර 30 කට ආසන්න කාලයක් පැවති ගැටුමෙන් සහ විරසක කමෙන් පසුව ශ්‍රී ලංකාව තවමත් පසුවන්නේ පුනර්ජීවනයේ මුල් අවස්ථාවේය.

මෙම සංචාරයේ දී මම සිංහල, දෙමල සහ කුරිරු එල්ටීටීඊයේ දෙමළ වින්දිතයන් සහ වෙනත් අතුරු හමුදා කණ්ඩායම් මුණ ගැසුනෙමි. ඝාතනයට ලක් වුවන්ගේ පවුල් සාමාජිකයන්, පැහැර ගත් හෝ හමුදාවට බඳවා ගත් දූ දරුවන්ගේ මවුවරුන්, උතුරේ තම නිවෙස්වලින් බලහත්කාරයෙන් ඉවත් කළ හෝ පලවා හැරි මුස්ලිම් ආගමිකයන්, කිසිදා ආපසු නොපැමිණි සොල්දාදුවන්ගේ මවුවරුන් සහ යුද්ධය නිසා දෙපාර්ශ්වයෙන්ම වින්දඹුවන් වූ දහස් ගණන් දෙනාගෙන් සමහරුන් මම හමු වූයෙමි. වසර ගණනාවක් වූ බෝම්බ දැමීම්, මිනී මැරුම් හා මෙම සමාජයට ඇතිකළ වෙනත් අපහරණ ගැන මා හොඳින් සංවේදී වෙමි.

ආරක්ෂක හමුදාවෙන් අත් අඩංගුවට ගත් හෝ ඊට භාර වීමෙන් පසුව අතුරුදහන් වූ පුද්ගලයන්ගේ මවුවරුන් හා බිරින්දෑවරුන් මම හමු වූයෙමි. කිසියම් අපරාධයක් ගැන චෝදනා ඉදිරිපත් නොකර වසර ගණනාවක් රඳවා ගෙන සිටින සහ බලහත්කාරයෙන් ලබා ගන්තේයැයි කියන පාපෝච්චාරණ මත පමණක් පදනම් වූ චෝදනා ඉදිරිපත්ව ඇති අයගේ ඥාතීන් මම මුණ ගැසුණෙමි. වසර 30කට පමණ පෙර ජවිපෙ කැරලි සමයේ ආරක්ෂක හමුදාවෙන් දූෂණයට ලක්වීමෙන් අත් වූ මානසික කම්පනයෙන්

තවමත් වේදනා විඳින් ස්ත්‍රියක් මා හමු වූවාය. ඇගේත් අනෙකුත් වින්දිතයන්ගේ සහ ඔවුන්ගේ පවුල්වලත් වේදනාව දරා ගත නොහැකි තරම් බියකරුය. මෙවා සමනය කිරීමේ මාර්ග තිබියදී එය දිගටම පැවතීම කුරිරුය.

ගැටුම නිසා අවධානය වෙනතකට යොමු වීම නිසා ශ්‍රී ලංකාවට ස්ත්‍රීන්, ආබාධිත පුද්ගලයන්, වෙනස් වූ ලිංගික නැඹුරුතාවලින් යුත් මිනිසුන් සහ මධ්‍යම ශ්‍රී ලංකාවේ වතු දෙමළ ජනතාව වැනි වෙනස් කොට සැලකීමෙන් පීඩා විඳින වෙනත් කණ්ඩායම් මුහුණ දෙන උග්‍ර වූ ගැටළුවලට විසඳුම් ලබා දීමටත් අපොහොසත් විය. මේ අය සහ අත් හරින ලද හෝ වෙනස් කොට සලකන වෙනත් කණ්ඩායම් සහ සුළුතර කණ්ඩායම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන ක්‍රියාවලිය තුළ පමණක් නොව අනෙකුත් ක්ෂේත්‍රවලද ඔවුන්ට හිමි විය යුතු අවධානය ලැබෙනු ඇතැයි මම අපේක්ෂා කරමි.

දිග් ගැසුණු ගැටුමකින් සිදු වූ හානිය පිලිසකර කිරීම අතිශයෙන් සංකීර්ණ වූ කාර්ය භාරයක් වන අතර එහි මුල් කාලය තිරණාත්මකය. මුල් වසර කිපය තුළ වැරදි සිදු කළහොත් හෝ කැපී පෙනෙන ප්‍රශ්න යටපත් කළහොත් හෝ නොසලකා හැරියොත් කාලය ගතවෙත්ම ඒවා තෝරා බේරා ගැනීම ක්‍රම ක්‍රමයෙන් අසීරු වනු ඇත. වීදුරුව ගිනියම්ව පවතින විට කඩිසර දක්ෂ පුද්ගලයෙකුට එය වසර ගණනාවක් පවතින සියුම් භාණ්ඩයක් බවට පත් කළ හැකිය. වීදුරුව හැඩ රුවක් නැතිව ඝනවීමට පටන් ගත් විට හැඩ ගැන්වීම වඩ වඩාත් දුෂ්කරය. ඒ ආකාරයටම පශ්චාත් ගැටුම් විසඳීමේ මූලික ලක්ෂණ හතරෙන් - සත්‍යය කීම, වගවීම, හානි පූරණය සහ ආයතනික ප්‍රතිශෝධන- එකක් හෝ අමතක කළොත් හෝ වැරදි ලෙස භාවිතා කළ හොත් නොවිසඳි විරසකකම් පැසවා නව ඒවා මතු වනු ඇත. එය වඩාත් පුළුල් සමෘද්ධියක් අත් කර දෙන දීර්ඝ කාලීන ස්ථාවරත්වය ස්ථාපනය කිරීමේ අගනා අවස්ථාවක් අහිමි විමකි.

ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් බලන විට රටේ විශාල ප්‍රදේශයක් පසුගිය දශක තුනෙන් වැඩිම කාලයක් භෞතිකව, දේශපාලනිකව, සමාජයීය වශයෙන් සහ ආර්ථිකව අඩු වැඩි ප්‍රමාණයෙන් එකිනෙකින් වෙන්ව පැවතිණ. රාජ්‍යය කෙරේ සහ ප්‍රජාවන් අතර විශ්වාසය නැවත ගොඩ නැගීමට වසර ගණනාවක දේශපාලන අධිෂ්ඨානය, කැපවීම සහ මනා සම්බන්ධීකරණය සහ සැලසුම් අවශ්‍යවනු ඇත.

කොළඹට පැමිණෙන කෙනෙකුට කාර්ය බහුල නගරයක්, හාත් පසම ගොඩනැගිලි ඉදි කිරීම්, පිරිසිඳු වීදි සහ සමෘද්ධිමත් ව්‍යාපාරික ස්ථාන දැකිය හැකිය. සරු සාර් සංචාරක කර්මාන්තයක් ද දැකිය හැකිය.

උතුරට සහ නැගෙනහිරට යන විට අඩුම වශයෙන් තැන් තැන්වල විනාශයට පත් සහ හානියට පත් ප්‍රදේශ, දරිද්‍රතාවය, හා තවමත් පවතින අවතැන්වීම් දැකිය හැකිය. ඇත්තෙන්ම භෞතික සංවර්ධනයේ සලකුණු ද දැකිය හැකිය. ඡන්දයෙන් තේරීපත් වූ නියෝජිතයන්ගේ සාධනීය දැක්ම සහ අභිලාෂයන්. තවමත් ඵල නොදැරූ අපේක්ෂා හා දැනටමත් වියැකී ගිය බවට සලකුණු ඇති බලාපොරොත්තුවල අඳුරු සලකුණු ද දැකිය හැකිය.

සියලු ශ්‍රී ලාංකිකයන්ගේ අයිතිවාසිකම් පූර්ණ වශයෙන් තහවුරු කෙරෙන ඉතා වැදගත් යෝජිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට මහත් සහයෝගයක් පවතින අතර පසු අවස්ථාවක මෙය ඒ හා සමාන වැදගත්කමකින් යුත් සත්‍යය කීම, යුක්තිය හා වගවීම වැනි වෙනත් ක්‍රියාවලීන් අමතක කිරීමෙන් සාක්ෂාත් කර ගනු ඇතැයි බියක් ද පවතී.

ජාතික උපදේශන ක්‍රියාවලියට නායකත්වය දීමට පත් කරන ලද කාර්ය සාධක බලකායට ගුණාත්මක භාවයෙන් ඉතා උසස් සිවිල් සමාජයේ නියෝජනයක් ඇතුළත් වන නමුත් මෙම ක්‍රියාවලිය හදිසියේම සිදු කරන ලද හා නිසි පරිදි සැලසුම් කිරිමක් හෝ ප්‍රමාණවත් සම්පත් ලබා දීමක් නැතිව කරන ලදැයි හැඟීමක් කාර්ය සාධක බලකායේ සාමාජිකයන් අතර පවා පවතී.

විශ්වාසය සිදී යෑමේ ප්‍රවනතාවය වෙනස් කිරීමට ගත හැකි කඩිනම් සමහර පියවර ඇත. සියල්ලට පළමුව හමුදාව අත්පත් කර ගත් සහ තවමත් සතු කර ගෙන ඇති ඉඩම් ඒවායේ නිත්‍යානුකූල අයිතිකරුවන්ට ආපසු බාර දීම කඩිනම් කිරීමේ අවශ්‍යතාවයක් පවතී. යාපනයේ සහ ත්‍රිකුණාමලය ප්‍රදේශවල යම් ප්‍රමාණයක ඉඩම් ආපසු භාර දී ඇති අතර වහාම භාර දිය යුතු සහ භාර දිය හැකි විශාල භූමි ප්‍රදේශයක් තවමත් පවතී. ඉඩම් ආපසු ලබා දුන් පසු අවතැන් වූ ප්‍රජාවට අවශ්‍ය ආධාර ලබා දෙන්නේ නම් තම නිවෙස්වලට පැමිණීමෙන් කලක් තිස්සේ පවතින වේදනාවක් සඳහටම නිමා වනු ඇත. ඊට සමාන්තරව උතුර සහ නැගෙනහිර සිටින හමුදා බලකා ප්‍රමාණය ආරක්ෂක අංශයේ ප්‍රතිශෝධනවල පළමු පියවර වශයෙන් පිටස්තර බවින් සහ තර්ජනාත්මක ස්වභාවයෙන් වඩාත් අඩු තත්වයකට පත් කිරීමට අඩු කළ හැකිය.

ඉතිරිව සිටින ආරක්ෂාවට අදාල රැඳවියන්ට නඩු පැවරීමට හෝ ඔවුන් නිදහස් කිරීමට කඩිනම් වැඩපිළිවෙළක් ආණ්ඩුව සොයා ගත යුතුය. අතුරුදහන් පුද්ගලයන් සියල්ලන්ම පාහේ මිය ගොස් ඇතැයි අගමැතිවරයා මෑතක දී කළ ප්‍රකාශය තවමත් ඔවුන් ගැන බලාපොරොත්තුව සිටින පවුල් තුළ මහත් ශෝකයක් ඇති කරවීය. මෙම ප්‍රකාශයත් සමගම තවමත් ජීවතුන් අතර සිටින්නේ කවුද, මැරුණේ හෝ මරා දමන ලද්දේ කවුද, ඒවා නිත්‍යානුකූල වන්නේද නැද්ද යන්න ඇතුළත් ඔවුන්ගේ මරණ ගැන නිසි විස්තරයක්, මළ සිරුරු ඇති ස්ථාන සොයා ගැනිම සහ සහන ලබා දීම සඳහා ඉක්මන් පියවර ගත යුතුය.

ඇත්තෙන්ම මා මෙහිදී සහභාගි වූ සෑම හමුවකම න්‍යාය පත්‍රයේ ඉහළින්ම වූයේ ශ්‍රී ලංකාව ද සම යෝජකයෙක් වූ සහ මණ්ඩලයේ සාමාජික රාජ්‍ය 47 සියලු දෙනාම ඒකමතිකව අනුමත කළ එක්සත් ජාතින්ගේ මානව අයිතිවාසිකම් මණ්ඩලය ඔක්තෝබර් 1 වැනිදා සම්මත කළ යෝජනාව ක්‍රියාත්මක කිරිමට අදාල කරුණුය. මෙම යෝජනාවෙන් අනුගමනය කළ යුතු විශිෂ්ටතම හා සුදුසුම මාවත දැක්වෙන අතර ලබන ජුනි මස සහ නැවතත් 2017 මාර්තු මස එහි ප්‍රගතිය හෝ ප්‍රගතියක් නොමැතිකම මණ්ඩලයට වාර්තා කිරීම ඇතුළුව එම යෝජනාව ක්‍රියාත්මක කිරීම ගැන පසුවිපරම් කිරීම මගේ කාර්යාලයට පැවරී ඇත.

මානව අයිතිවාසිකම් මණ්ඩලයේ යෝජනාව සහ එය පදනම් වූ සහ මණ්ඩලය අනුමත කළ සවිස්තරාත්මක වාර්තාවෙන් අරමුණු වන්නේ ප්‍රතිසන්ධානය, වගවීම සහ මානව අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීමය. එම වාර්තාව සහ ඒ සමග වූ යෝජනාව නිකුත් කිරීමත් සමග අවසානයේ දී ශ්‍රී ලංකාවේ ඉමහත් වේදනාකාරී සහ ඛේදනීය ගැටුමේ අවසන් වසර කීපය තුළ සිදු වූයේ කුමක්ද යන්න සම්පූර්ණයෙන්ම පිළිගැනීමේ ආරම්භයක් වශයෙන් සන්ධිස්ථානයකට ළඟා වූයේයැයි ඉමහත් අපෙක්ෂාවක් ජනිත කෙරිණ.

මානව අයිතිවාසිකම් මණ්ඩලයේ යෝජනාව බොහෝ ආකාරයෙන් පසුගිය ජනාධිපතිවරණයේ දී සහ පාර්ලිමේන්තු මැතිවරණයේ දී ශ්‍රී ලාංකිකයන් අනුමත කළ ප්‍රතිශෝධන න්‍යාය පත්‍රයේම පිළිබිඹුවකි. ඒවායින් ප්‍රතිසන්ධානය සහ වගවීමත් ඒ තුළින් චිරස්ථායි සාමයත් සාක්ෂාත් කර ගැනීමට ගත යුතු සමහර පියවර දක්වයි.

එම යෝජනාව සහ ඉන් ශ්‍රී ලංකාවට අදහස් වන්නේ කුමක්ද යන්න ගැන මිත්‍යාවන් සහ සාවද්‍ය අදහස් ගණනාවක් පවතී. එය ශ්‍රී ලංකාවේ ස්වෛරීත්වයට හෝ ස්වාධීනත්වයට හෝ ඇඟිලි ගැසිමට හෝ යටපත් කිරිමේ අනියම් ප්‍රයත්නයක් නොවේ. එය කිසියම් අපැහැදිලි විදේශ බලයක යටත්විජිතවාදී බලපෑමක් සේ පෙනෙන ක්‍රියාවක් ද නොවේ. එම යෝජනාව පිළිගැනීම ශ්‍රී ලංකාවේ දුර්වල කමක් නොව ශක්තිය විදහා පෑමකි. එය අතීතයට අවංකව මුහුණ දීමට රටටත් ලෝකයටත් වන පොරොන්දුවක් මෙන්ම එසේ කිරීමෙන් අනාගතයේ දී විනාශකාරී වාර්ගික විරසකකම් සහ ගැටුම් හට ගැනිමට එරෙහි පූර්ණ රක්ෂණ ආවරණයක් ද වේ.

ලෝකයට ශ්‍රී ලංකාව ජයග්‍රාහී වනු දැකීමට අවශ්‍යය. ශ්‍රී ලංකාවේ කල් පවත්නා සාර්ථකත්වය පිළිබඳ අවස්ථා විද්‍යාමානව පවතින බව දකී. පසුගිය ඔක්තෝබර් මස මානව අයිතිවාසිකම් මණ්ඩලයේ යෝජනාවෙන් දක්වෙන මාවත සැකසීමට මෙපමණ කාලයක් සහ ශක්තියක් වැය කරන්නේ එම නිසාය. එම යෝජනාව සහ ඊට පදනම් වූ වාර්තාවෙන් සැබැවින්ම පවසන්නේ කුමක්ද යන්න තේරුම් ගැනීමට උත්සාහ ගන්නා ලෙස සියලුම ශ්‍රී ලාංකිකයන්ගෙන් මම ඉල්ලා සිටිමි. එම නිර්දේශ එතරම් වැදගත් වන්නේ ඇයිද යන්න සහ එක්සත් ජාතීන් සහ ශ්‍රී ලංකාව ඇතුළුව එක් එක් රටවල් ඒවා අනුමත කෙළේ ඇයිද යන්නත් තේරුම් ගැනීමට වඩාත් වැඩි ප්‍රයත්නයක් ගන්නා ලෙස කිසියම් තත්වයක සිටින සියල්ලන්ගෙන් ඉල්ලා සිටිමි. සමහර විට සියලු ප්‍රතිශෝධන, යුක්තිය, වගවීම හා ප්‍රතිසන්ධානය ලබා දීමට ගන්නා සියලු ප්‍රයත්නයන් තුළින් ඒවා යටපත් කිරීමට අපේක්ෂා කරන අයගේ අනතුරු හැඟවීමේ උත්සාහය අඩුවනු ඇත. මෙම තීරණාත්මක මුල පිරුම් කෙරේ ඇති විශ්වාසය යටපත් කිරීමට තැත් කරන අය මේ රටේ අනාගත සාමය සහ ස්ථාවරත්වය අනතුරට පත් කිරීමේ ක්‍රියාවක යෙදී සිටිති.

රටක් ස්ථාවර වීමටනම්, සාර්ථක වීමටනම් ඊට ප්‍රබල, අපක්ෂපාතී සහ විශ්වාස කටයුතු අධිකරණ පද්ධතියක් තිබිය යුතුය. ආරක්ෂක සේවා සහ අධිකරණය එහි සියලු ජනතාවගේ වුවමනාවන් වෙනුවෙන් ක්‍රියාත්මක විය යුතුය. දරදඬු ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත හා අනෙකුත් හදිසි බලතල මත රැඳීම ඇතුළත්ව දශක තුනක් තිස්සේ පැවති ගැටුම සහ මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම්වලින් බරපතළ ලෙස පරිහානියට හා දූෂණයට ලත් වූයේ රටේ රටේ මූලික ආයතන ඇති මෙම ක්ෂේත්‍රයි. අන්තර්ජාතික ප්‍රජාව යෝජනාවේ සහ වාර්තාවේ ඇතුළත් නිර්දේශ ක්‍රියාත්මක කිරීම හරහා ශ්‍රී ලංකාවේ ප්‍රතිස්ථාපනය කිරීමට දැඩි ප්‍රයත්නයක් ගන්නේ ජනතාවගේ භක්තිය මත රඳා පවතින මෙම ආයතනවල ප්‍රබලත්වයයි.

ශ්‍රී ලංකාවේ විශිෂ්ට විනිශ්චයකරුවෝ, නීතිඥයෝ සහ නීතිය බලාත්මක කරන නිලධාරීහු සිටිති. නමුත් වසර ගණනාවක් තිස්සේ ඔවුන් මත රඳා පවතින සහ ඔවුන් රඳා සිටින මෙම පද්ධතිය අතිශයෙන් දේශපාලනීයකරණය වීමටත්, සමබර තාවය නැතිවීමටත් සහ විශ්වාසයක් නැති බවටත් පත්ව ඇත. පසුගිය දශක ගණනාවක සිට මෙම රටේ ඉතිහාසය අධිකරණයේ අසාර්ථකවීම්වලින් ගහණය. ඇත්තෙන්ම සෑම ශ්‍රී ලාංකිකයෙක්ම මෙය පිළිගනී. අගමැතිවරයා ජනවාරි 27 වැනි දා පැවති පාර්ලිමේන්තු විවාදයේ දී අගය කළ යුතු විවෘත භාවයකින් දීර්ඝ ලෙස කරුණු දක් වූයේය. ඇත්තෙන්ම සෑම සතියකම අසාර්ථක විමර්ශනයක් ගැන, උසාවියකට කඩා වදින මැර කල්ලියක් ගැන හෝ අපරාධයකට දඬුවම් නොලැබීමේ තවත් නිදසුනක් ගැන ප්‍රවෘතියක් ඇසිය හැකිය. ස්ත්‍රීන්ට සහ තරුණියන්ට එරෙහි ලිංගික ප්‍රචණ්ඩත්වය සහ හිරිහැර කිරීම්වල වරදකරුවන්යැයි කියන අය විශේෂයෙන්ම හමුදා හෝ ආරක්ෂක සේවාවල සාමාජිකයන් නම් ඒවා ගැන කටයුතු කෙරෙන්නේ දුර්වල ආකාරයෙනි. එහි ප්‍රතිඵලයක් වශයෙන් එවැනි සිද්ධීන් පුළුල් ලෙස සිදු වේ.

වාර්තාවෙන් සහ මානව අයිතිවාසිකම් මණ්ඩලයේ යෝජනාවෙන් අන්තර්ජාතික අපරාධ සහ දෙපාර්ශ්වයේම පුද්ගලයන් විසින් සිදු කරන ලදැයි කියන බරපතළ මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් පිළිබඳව කටයුතු කිරීමට පිහිටුවන වගවීමේ යාන්ත්‍රණයකට අන්තර්ජාතික සහභාගිත්වයක් යෝජනා කරන්නේ මෙම හේතුව නිසාය. මා කලින් සඳහන් කළ තථ්‍ය සහ ප්‍රායෝගික ප්‍රශ්න විසඳීමේ ප්‍රායෝගික යෝජනාව මෙයයි. එහෙත් එය 2015 එක්සත් ජාතීන්ගේ වාර්තාවෙන් සහ යෝජනාවෙන් දක්වෙන පුළුල් පියවර ගණනාවකින්, ඉතා වැදගත් එකක් වුවද එක පැත්තක් පමණි. මෑත දිනවල ශ්‍රී ලංකාවේ මතු වූ විවාදයේ දී එය ප්‍රමුඛස්ථානයට පත්වීමට ඉඩ හැරි ආකාරය කණගාටුදායකය. ශ්‍රී ලංකාවේ පවතින ගැටුමේ කේන්ද්‍රය වන්නේ සීමාන්තික ජාතිවාදී ප්‍රවනතාවයන් ය. ඒවාට රට යළිගොඩ නැගීමේ දීර්ඝ කාලීන අවස්ථා යටපත් කිරීමට නැවත වරක් ඉඩ නොහැරිය යුතුය.

ශ්‍රී ලාංකිකයන් විශාල වශයෙන් වෙනසක්, ප්‍රතිසන්ධානයක්, සත්‍යය හා යුක්තිය සඳහා ඡන්දය ප්‍රකාශ කෙළේ වසරකට පමණ පෙරය. කඩා කප්පල් කිරීම අරමුණු කර ගත් දෙපාර්ශ්වයේම අන්තවාදී හඬ නගන සුළුතරයකට අපේක්ෂාව විය යුතු තැන භීතිය පැතිරවීමට ඉඩ හරින්නේ නම් මහත් ලැජ්ජාවකි.

ශ්‍රී ලංකාවේ අනාගතය රඳා පවතින ඉතාමත් බරපතළ මෙම කරුණු ගැන ගැඹුරු විවාදයක් අවශ්‍ය ය. සියලු ශ්‍රී ලාංකිකයන් මෙම ක්‍රියාවලිය පිටුපස පෙළ ගැසීමත්, සියලු පාර්ශ්වවල සියලු වින්දිතයන්ගේ අදහස් වඩාත් හොඳින් තේරුම් ගැනිමත් වැදගත් නිසාත් එක්සත් ජාතීන්ගේ 2015 සැප්තැම්බර් වාර්තාවේ සවිස්තරාත්මක සොයා ගැනීම් පිළිබඳව පූර්ණ. අව්‍යාජ සහ අවංක සාකච්ඡාවක් ආරම්භ කිරීමේ අවශ්‍යතාවයක් පවතී.

විශාල වෙනස්කම් කිරීමට ඇති කැමැත්ත රජය පෙන්වා ඇත. එහෙත් ආණ්ඩුව මානව අයිතිවාසිකම් පිළිබඳ සිය කැපවීමේ දී වැනෙන සුළු බවක් දක්වන්නේයැයි බියක් උතුරු නැගෙනහිර වින්දිතයන්ගෙන් මෙන්ම මෙහි කොළඹ සිටින සමහර බුද්ධිමත්ම විශ්ලේෂකයන්ගෙන් මට අසන්නට ලැබිණ. අද උදයේ ජනාධිපති සහ අගමැති යන දෙදෙනාගෙන්ම මේ සම්බන්ධයෙන් ඔවුන් තුළ ඇති කැපවීම අසන්නට ලැබීමෙන් මම සෑහීමට පත් වූයෙමි.

මෙය හැකි පමණ පැහැදිලිව කීමට ඉඩ දෙන්න. කිසියම් සැක සංකාවක් නැතිව ශ්‍රී ලංකාව තම කණ්ඩායමට එකතු කර ගැනිමට ජාත්‍යන්තර ප්‍රජාවට අවශ්‍යය. ශ්‍රී ලංකාව ආර්ථික බලාගාරයක් කිරීමට උදවු කිරීමට ඊට අවශ්‍යය. ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාව නැවත වරක් ජාත්‍යන්තර සාම සාධක මෙහෙයුම්වල දී නිර්මාණාත්මක භූමිකාවක් ඉටු කරනු දකිමට, එහි සාමාජිකයන් බොහෝ දෙනෙකුට ලැබිය යුතු ගෞරවය ලබා ගැනීමට හා එහි කීර්තියට වූ කළු පැල්ලම් පිස දමනු දැකීමට ඊට අවශ්‍යය.

මේ සියල්ල එල දැරීමටනම් ශ්‍රී ලංකාව එහි අතීතයේ වූ භූතයන්ට අභියෝග කොට ඒවා පරාජය කළ යුතුය. ක්‍රියාත්මක වන ආයතන නිර්මාණය කොට වගවීම තහවුරු කළ යුතුය. තම සියලු ජනතාවට සත්‍යය, යුක්තිය, ආරක්ෂාව සහ සමෘද්ධිය සැලසීමට දැන් පවතින සුවිශේෂී අවස්ථාව ග්‍රහණය කර ගත යුතුය. එය සාක්ෂාත් කර ගැනීමට උදවු වනු සඳහා මගේ පාර්ශ්වයෙන් කළ හැකි සියලු දේ කෙරෙන අතර ඉතා දුෂ්කර මෙම ක්‍රියාවලිය තුළින් ශ්‍රී ලංකාව සමග ඉදිරියට යෑමටත් මගේ කාර්යාලයේ සේවය දිගටම ලබා දෙනු ඇත.

ඔබට ස්තුතියි.